Australian Government

Fair Work OMBUDSMAN

# සාධාරණ රාජකාරි තොරතුරු ප්‍රකාශනය

සේවායෝජකයන් විසින් මෙම ලියවිල්ල නව සේවකයන් රාජකාරි ආරම්භ කරන විට ඔවුනට ලබාදිය යුතුය

## ඔබගේ වැටුප් සහ කොන්දේසි සම්බන්ධ වැදගත් තොරතුරු

කොරෝනා වෛරසයේ බලපෑම සහිත කාලය තුළ ඔබගේ සේවාස්ථානය හා අදාළ හිමිකම් සහ යුතුකම් ගැන වැඩි විස්තර දැන ගැනීමට **coronavirus.fairwork.gov.au** වෙත යන්න.

**පහත නීතීන් යටතේ ඕස්ට්‍රලියානු සේවායෝජකයන් හට රාජකාරි කරන අතරතුර හිමිකම් සහ ආරක්ෂාවන්**

**සාධාරණ රාජකාරි නීතීන්**

- සියළු සේවකයන් සඳහා අවම හිමිකම්
- National Employment Standards (ජාතික රැකියා සම්මතයන්) ඇතුලත්වේ

**ප්‍රදාන**

- කර්මාන්තයකට හෝ වෘත්තියකට අදාල අවම වේතන සහ කොන්දේසි නිර්ණය කිරීම
- ඕස්ට්‍රලියාවේ බොහෝ සේවකයන් මෙයින් ආවරණයවේ

**ව්‍යවසාය ගිවිසුම්**

- නිශ්චිත රාජකාරි ස්ථානයකට අදාල අවම වේතන සහ කොන්දේසි නිර්ණය කිරීම
- විධිමත් ක්‍රියාවලියක් මගින් සාකච්ඡා කර අනුමත කිරීම සිදුවේ

**රැකියා ගිවිසුම්**

- තනි සේවකයෙකු සඳහා අමතර කොන්දේසි සැපයීම
- අවම හිමිකම් අඩු කිරීම හෝ ඉවත් කිරීම කල නොහැක

ඔබගේ ප්‍රදානය **www.fairwork.gov.au**. යන වෙබ්අඩවිය වෙත පිවිසීමෙන් සොයා ගන්න. **www.fwc.gov.au/agreements** වෙබ්අඩවිය වෙත පිවිසීමෙන් ඔබගේ රැකියා ස්ථානයේ ව්‍යවසාය ගිවිසුමක් ඇතිද යන්න සොයා ගන්න.

## අනියම් සේවකයෝ

ඔබ අනියම් සේවකයෙකු නම්, ඔබ රැකියාව ආරම්භ කරන විට ඔබ වෙත අනියම් සේවානියුක්තිය හා අදාළ තොරතුරු ප්‍රකාශනය ලබා දිය යුතු වේ. වැඩි විස්තර සඳහා **www.fairwork.gov.au/ceis** වෙත පිවිසෙන්න.

## වේතන

**ඔබගේ අවම වේතන අනුපාතය ඔබගේ ප්‍රදානයේ හෝ ව්‍යවසාය ගිවිසුමේ සඳහන්වේ.** ඔබගේ රැකියාවට ප්‍රදානයක් හෝ ගිවිසුමක් නැතිනම්, ඔබ හට ජාතික අවම වැටුප හෝ හිමිවිය යුතුවේ. **ඔබට මීට අඩුවෙන් ගෙවීම් ලැබීමට එකඟ විය නොහැක.** අවම වැටුප් අනුපාත වාර්ෂිකව යාවත්කාලීනවේ.

ඔබට ලැබිය යුතු ප්‍රමාණය **www.fairwork.gov.au/minimum-wages** යන වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් සොයා ගන්න.

**ජාතික අවම වේතන**
2021 ජූලි 1වන දින සිට

පැයට/**$20.33**
ස්ථිර කාල හෝ අර්ධ කාල

පැයට/**$25.41**
අනියම් (casual)

**ප්‍රදානයක් හෝ ව්‍යවසාය ගිවිසුමක් නොමැති සේවකයන් හට ගෙවිය යුතු වැඩිහිටි අනුපාතය මෙයවේ.**
කණිෂ්ඨයන්, ආධුනිකයන් සහ ආබාධිතබව ඇති සේවකයන් සඳහා මෙයට වඩා අවම අනුපාත අදාල විය හැකිය.

ඔබගේ වැටුප්, නිවාඩු සහ සේවය අවසන් කිරීමේ දී ඇති හිමිකම් පරීක්ෂා කර ගැනීම සඳහා අපගේ වෙබ්අඩවියේ නොමිළේ ලබාදෙන ගණක භාවිතා කරන්නඃ
**www.fairwork.gov.au/pact**

## ජාතික රැකියා සම්මතයන්

මේවා සියළු සේවකයන් සඳහා අවම සම්මතයන්වේ. රීතීන් සහ බැහැරකිරීම් අදාලවේ. **ඔබගේ ප්‍රදානය හෝ ගිවිසුම මගින් මෙයට වැඩි ප්‍රතිලාභ ලබාදිය හැකිවේ.** ජාතික රැකියා සම්මතයන් සම්බන්ධ වැඩිදුර විස්තර **www.fairwork.gov.au/NES** වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් ලබාගත හැක.

| | **පූර්ණ කාලීන සහ අර්ධ කාලීන සේවකයන්** | **අනියම් සේවකයන්** |
|---|---|---|
| **වාර්ෂික නිවාඩු** | ✓ වසරකට සති 4ක වැටුප් සහිත නිවාඩු (අර්ධ කාලීන සේවකයන් සඳහා අනුපාතිකව) + සුදුසුකම් ඇති වැඩ මුර සේවකයන් හට සති 1ක් | ✗ |
| **පුද්ගලික නිවාඩු** (අසනීප හෝ රැකබලා ගැනීම සඳහාවූ නිවාඩු) | ✓ වර්ෂයකට දින 10ක් වැටුප් සහිත නිවාඩු (අර්ධ කාලීන සේවකයන් සඳහා අනුපාතිකව) | ✗ |
| **රැකබලා ගැනීම සඳහාවූ නිවාඩු** | ✓ අවසර ඇති සිදුවීමකට දින 2ක් වැටුප් රහිත නිවාඩු (වැටුප් සහිත පුද්ගලික නිවාඩු ඉතිරිව නැතිනම්) | ✓ අවසර ඇති සිදුවීමකට දින 2ක් වැටුප් රහිත නිවාඩු |
| **සානුකම්පිත නිවාඩු** | ✓ අවසර ඇති සිදුවීමකට දින 2ක් වැටුප් සහිත නිවාඩු | ✓ අවසර ඇති සිදුවීමකට දින 2ක් වැටුප් රහිත නිවාඩු |
| **පවුල් සහ ගෘහස්ථ හිංසන නිවාඩු** | ✓ මාස 12කට දින 5ක් වැටුප් රහිත නිවාඩු | ✓ මාස 12කට දින 5ක් වැටුප් රහිත නිවාඩු |
| **ප්‍රජා සේවා නිවාඩු**<br>• ජූරි සේවාව | ✓ අඩු වැටුප් ප්‍රමාණය ගෙවීම සහිත දින 10ක වැටුප් සහිත නිවාඩු + අවශ්‍ය පරිදි වැටුප් රහිත නිවාඩු | ✓ අවශ්‍ය පරිදි වැටුප් රහිත නිවාඩු |
| • ස්වේච්ඡා ආපදා කළමණාකරණ ක්‍රියාකාරකම් | ✓ අදාල ක්‍රියාකාරකමට සහභාගිවීම සඳහා වැටුප් රහිත නිවාඩු | ✓ අදාල ක්‍රියාකාරකමට සහභාගිවීම සඳහා වැටුප් රහිත නිවාඩු |
| **දිගු කාලීන සේවා නිවාඩු** | ✓ වැටුප් සහිත නිවාඩු (මුදල සහ සුදුසුකම් ලබන රීතීන් ප්‍රාන්ත සහ ටෙරිටරි අනුව වෙනස්වේ) | ✳ ප්‍රාන්ත සහ ටෙරිටරි අනුව වෙනස්වේ |
| **මාපිය නිවාඩු**<br>මාස 12ක සේවයෙන් පසු සුදුසුකම් ලබයි | ✓ මාස 12ක වැටුප් රහිත නිවාඩු - සේවායෝජකගේ එකඟතාවය ඇතිව මාස 24 දක්වා දිගුකල හැකිය | ✓ නිතිපතා සහ ක්‍රමානුකූල අනියම් සේවකයන් සඳහා මාස 12ක වැටුප් රහිත නිවාඩු - සේවායෝජකගේ එකඟතාවය ඇතිව මාස 24 දක්වා දිගුකල හැකිය |
| **උපරිම වැඩ කරන පැය ගණන** | ✓ පූර්ණ කාලීන සේවකයන් - සතියට පැය 38 + අමතර සාධාරණ පැය ගණනක්<br>අර්ධ කාලීන සහ අනියම් සේවකයන් - පැය 38ක් හෝ සේවකයාගේ සාමාන්‍ය සතියේ පැය ගණන (දෙකින් වඩා අඩු එක) + සාධාරණ අමතර පැය ගණනක් | |
| **රජයේ ප්‍රසිද්ධ නිවාඩු** | ✓ ඔබ සාමාන්‍යයෙන් වැඩ කරයි නම්, වැටුප් සහිත නිවාඩු දිනයක්. ඔබට වැඩ කරන ලෙස ඉල්ලා සිටියහොත්, සාධාරණ නම් ප්‍රතික්ෂේප කල හැකිය | ✓ වැටුප් රහිත නිවාඩු දිනයක්. ඔබට වැඩ කරන ලෙස ඉල්ලා සිටියහොත්, සාධාරණ නම් ප්‍රතික්ෂේප කල හැකිය |
| **සේවා අවසන් කිරීමේ දැන්වීම** | ✓ සේවයේ කාලය සහ වයස අනුව සති 1-5 දක්වා කාලයක් (නැතිනම් දැන්වීම වෙනුවට වැටුප් ගෙවීම) | ✗ |
| **අතිරික්ත සේවකයන් ඉවත් කිරීමේදී සිදු කරන ගෙවීම**<br>රැකියාව ආරම්භ කර මාස 12කට පසු සුදුසුකම් ලබයි | ✓ සේවයේ කාලය අනුව සති 4-16 දක්වා කාලයක් (සමහර බැහැර කිරීම් අදාලවේ) | ✗ |
| **අනියම් පරිවර්තනය** | ✗ | ✓ යම් යම් තත්ත්වයන් යටතේ පූර්ණ කාලීන හෝ අර්ධකාලීන සේවකයෙකු වීම සඳහා ඇති අයිතිය |

Australian Government
Fair Work OMBUDSMAN

# සාධාරණ රාජකාරි තොරතුරු ප්‍රකාශනය

සේවායෝජකයන් විසින් මෙම ලියවිල්ල නව සේවකයන් රාජකාරි ආරම්භ කරන විට ඔවුනට ලබාදිය යුතුය

## ඔබගේ වැටුප් සහ කොන්දේසි සම්බන්ධ වැදගත් තොරතුරු

### සුනම්‍යතාව

මාස 12ක සේවයෙන් පසු, ඔබ වයස 55 හෝ ඊට වැඩිනම්, රැකවරණකරුවෙකු නම්, ආබාධිතබවක් ඇතිනම්, පවුල් සාමාජිකයෙකුගෙන් හිංසන අත්විඳින්නේ නම් (නැතිනම් එසේ අත්විඳින පවුලකට හෝ නිවෙසක සමාජිකයෙකු හට උපකාර කරන්නේ නම්), හෝ පාසල් වයසේ හෝ ඊට වඩා බාල දරුවෙකුගේ දෙමාපියන් හෝ එවැනි දරුවෙකුගේ රැකවරණ වගකීම් ඇතිනම්, **සුනම්‍ය රැකියා වැඩපිළිවෙලක් සඳහා ඉල්ලීමක්** ලිඛිතව ඉදිරිපත් කල හැකිය. මෙයට මාපිය හෝ දරුකමට හදා ගැනීමෙන් පසු නිවාඩු සිට පැමිණ දරුවා හට රැකවරණය ලබාදීම සඳහා අර්ධ කාලීනව රැකියා කිරීමට ඉල්ලා සිටින සේවකයන්ද ඇතුලත්වේ. ඔබගේ සේවකයා දින 21ක් ඇතුලත ලිඛිතව ප්‍රතිචාර දැක්විය යුතුය. සාධාරණ ව්‍යාපාර හේතු මත පමණක් ඔවුනට නැත යනුවෙන් පැවසිය හැකිය.

ඔබ සහ ඔබගේ සේවායෝජකයා හට තනි පුද්ගල **සුනම්‍ය වැඩපිළිවෙලක් කථාකර ගත හැක.** මේ මගින් ඔබගේ ප්‍රදානයේ හෝ ව්‍යවසායක ගිවිසුමේ සමහර කොන්දේසි ඔබට අදාල වන ආකාරය වෙනස් විය හැකිය. තනි පුද්ගල සුනම්‍ය වැඩපිළිවෙලක් නිර්ව්‍යාජ තේරීමක් විය යුතුය - – එය සේවා ගිවිසුමේ කොන්දේසියක් විය නොහැක – - එමෙන්ම ඒ මගින් සමස්ථ වශයෙන් ඔබ වඩා හොඳ ස්ථානයක තැබිය යුතුය. වැඩිදුර විස්තර සඳහා පහත වෙබ් අඩවිය වෙත පිවිසෙන්නඃ

**www.fairwork.gov.au/flexibility**

### ඔබ දැනගෙන සිටියාද?

ඔබගේ රැකියා ස්ථානයේ තොරතුරු එක ස්ථානයක තබා ගැනීම සඳහා ඔබට නොමිලේ ගිණුමක් ඇරඹිය හැකිය.
**www.fairwork.gov.au/register**

ඔබට නව රැකියාවක් ආරම්භ කිරීම සඳහා උපකාර ලබා ගැනීමට නොමිලේ ලබාගත හැකි මාර්ගගත පාඨමාලා සොයා ගත හැකිය. වැඩිදුර විස්තර සඳහා පහත වෙබ් අඩවිය වෙත පිවිසෙන්නඃ
**www.fairwork.gov.au/learning**

ඔබ වැඩ කරන පැය ගණන වාර්තා කර ගැනීම සඳහා **Record My Hours app** කඩිනම් සහ පහසුවේ. එය App Store සහ Google Play වෙතින් නොමිලේ ලබා ගත හැකිය.

### රැකියාව අවසන් කිරීම

ඔබගේ රැකියාව අවසානවුණු විට, ඔබගේ අවසාන ගෙවීම තුල වැටුප සහ භාවිතා නොකල වාර්ෂික නිවාඩු සහ දිගු සේවා නිවාඩු වැනි සියළුම **ගෙවිය යුතු හිමිකම්** ඇතුලත්ව තිබිය යුතුය.

ඔබ සේවය අවසන් කිරීමේ දැන්වීම හෝ ඒ වෙනුවට වැටුප් **ලැබීමට සුදුසුකම්** තිබිය යුතුය. ඔබ දරුණු විෂමාචාරය සම්බන්ධයෙන් සේවයෙන් පහකරන ලද්දේ නම්, ඔබට දැනුම්දීමට අවශ්‍ය නැත. ඔබ විසින් ඉල්ලා අස්වන්නේ නම්, ඔබ විසින් ඔබගේ සේවායෝජකට දැනුම්දීමක් කල යුතු විය හැකිය. දැනුම්දීම අවශ්‍යද සහ ඔබගේ අවසාන ගෙවීමට ඇතුලත්විය යුතු දෙය සොයා ගැනීම සඳහා පහත වෙබ් අඩවිය වෙත පිවිසෙන්නඃ

**www.fairwork.gov.au/ending-employment**

**ඔබව සේවයෙන් පහකිරීම අසාධාරණ බව ඔබ සිතයි නම්,** ෆෙයාර් වර්ක් කොමිසම වෙත ඉල්ලීමක් කිරීමට **දින දර්ශන දින 21ක් ඇත.** නීති සහ ව්‍යාතිරේක අදාලවේ. වැඩිදුර විස්තර පහත වෙබ්අඩවිය වත පිවිසීමෙන් සොයා ගන්නඃ

**www.fairwork.gov.au/termination**

### රැකියා කිරීමේදී ඇති ආරක්ෂාවන්

**සියළුම සේවකයන් හට රැකියා කිරීමේදී ආරක්ෂාවන් ඇත.** ඔබ රැකියා කරන ස්ථානයේ අයිතිවාසිකමක් අනුව කටයුතු කිරීම හේතුවෙන් ඔබට වෙනස් ආකාරයට හෝ වඩා නරක ආකාරයට සැලකීම කල නොහැක. උදාහරණ වශයෙන්, සුනම්‍ය රැකියා වැඩපිළිවෙලක් ඉල්ලා සිටීමට ඇති අයිතිය, නිවාඩු ගැනීම හෝ පැමිණිල්ලක් කිරීම හෝ ඔබගේ රැකියාව සම්බන්ධයෙන් විමසීමක් කිරීම.

ඔබට වෘත්තීය සමිතියකට බැඳීමට හෝ නොබැඳී සිටීමට අයිතිය ඇති අතර, නීත්‍යානුකූල කම්කරු ක්‍රියාකාරකම්වලට සහභාගිවීමට හෝ සහභාගි නොවී සිටීමට අයිතිය ඇත.

ඔබට අසනීප හෝ තුවාල නිසා තාවකාලිකව රැකියාවට නොගොස් සිටීමට, වෙනසකට ලක් නොවී සිටීමට, හිරිහැර සහ වධහිංසාවලින් තොරව සිටීමට, බලපෑම්වලට ලක් නොවී සිටීමට, වැරදි නිදේශනය නොමැතිවීමට, ව්‍යාජ ගිවිසුම් සහ අයුතු බලපෑම සහ පීඩනයන්ගෙන් ආරක්ෂාව ඇත. වැඩි විස්තර පහත වෙබ්අඩවිය වෙත පිවිසීමෙන් ලබාගත හැකඃ

**www.fairwork.gov.au/protections**

### ගිවිසුම් ඇතිකර ගැනීම

ව්‍යවසාය ගිවිසුම් සඳහා කේවළ කර ගන්නේ සේවායෝජකයන්, ඔවුන්ගේ සේවකයන් සහ සේවක නියෝජිතයන් (උදා. වෘත්තීය සමිති) අතරවේ. මෙම ක්‍රියාවලිය හඳුන්වන්නේ කේවළ කිරීම යනුවෙන් වන අතර එහිදී නිශ්චිත රීතීන් අනුව කටයුතු කල යුතුය. ව්‍යවසායක ගිවිසුමක් ඇතිකර ගැනීම, වෙනස්කර ගැනීම හෝ අවසන් කිරීම සම්බන්ධ වැඩි විස්තර පහත වෙබ්අඩවිය වෙත පිවිසීමෙන් ලබාගත හැකඃ

**www.fwc.gov.au/agreements**

### ව්‍යාපාරයක් පැවරීම

ව්‍යාපාරයක් පැවරීම සිදුවුවහොත්, පැරණි සේවායෝජකයා සමඟ ඔබගේ රැකියාව අවසානයට පත්වනු ඇත. නව සේවායෝජකයා විසින් ඔබව එම රැකියාවම (හෝ සමාන රැකියාවක්) කිරීමට මාස 3ක් ඇතුලත සේවයේ යොදවා ගතහොත්, සමහර හිමිකම් නව සේවායෝජක වෙත පැවරෙනු ඇත. උදාහරණයක් වශයෙන්, ව්‍යාපාරය අළෙවි කලහොත් හෝ පිටතට ලබාදුනහොත්, මෙය සිදුවිය හැකියඃ

**www.fairwork.gov.au/transfer-of-business**

### ඇතුළුවීමේ අයිතිය

ඇතුළුවීමේ අවසරපතක් ඇති වෘත්තීය සමිති නිලධාරීන් හට තමා නියෝජනය කරන සේවකයන් සමඟ කථා කිරීමට, හෝ ආරක්ෂාව පිළිබඳ සැක කරන කරුණු විමර්ශනය කිරීමට හෝ රැකියා ස්ථාන නීති උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් රැකියා ස්ථානයට ඇතුළුවිය හැකිය.

ඔවුන් සේවා යෝජකයා හට දැනුම්දීම වැනි, නිශ්චිත අවශ්‍යතාවයන්, හා අනුකූල විය යුතු අතර යම් ලියකියවිලි පරීක්ෂා කිරීම හෝ ඡායා පිටපත් ගැනීම කල හැකිය. බලපත්‍රධාරියා, ඔවුන්ගේ සංවිධානය සහ ඔබගේ සේවායෝජකයා හට දැඩි පුද්ගලිකතා නීති අදාලවේ. වැඩිදුර විස්තර පහත වෙබ් අඩවිය වෙත ප්‍රවේශවීමෙන් ලබාගත හැකියඃ

**www.fwc.gov.au/entry-permits**

## උපකාර කල හැක්කේ කා විසින්ද?

**ෆෙයාර් වර්ක් ඔම්බඩ්ස්මන්**

- වැටුප් සහ හිමිකම් සම්බන්ධ තොරතුරු සහ උපදෙස්
- නොමිලේ ගණක යන්ත්‍ර, ටෙම්ප්ලේට් සහ පාඨමාලා
- රැකියා ස්ථානවල ගැටළු විසඳා ගැනීම සඳහා උපකාර
- රැකියා ස්ථානවල නීති උල්ලංඝණය කිරීම සම්බන්ධ විමර්ශණ සහ බලාත්මක කිරීම්.

**www.fairwork.gov.au - 13 13 94**

**ෆෙයාර් වර්ක් කොමිසම**

- අසාධාරණ ලෙස සේවයෙන් ඉවත් කිරීම, නීතිවිරෝධී ලෙස සේවයෙන් පහ කිරීම, හිරිහැර කිරීම්, වෙනසකට ලක් කිරීම් හෝ අහිතකර ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධ ඉල්ලීම්වලට සවන්දීම
- ව්‍යවසාය ගිවිසුම් අනුමත කිරීම, වෙනස් කිරීම සහ අවසාන කිරීම
- ඇතුලත්වීමේ බලපත්‍ර නිකුත් කිරීම සහ කාර්මික ආරවුල් විසඳාලීම.

**www.fwc.gov.au - 1300 799 675**

ඔබ වාණිජ ගොඩනැගිලි කර්මාන්තයේ රැකියා කරයි නම් ඕස්ට්‍රලියානු ගොඩනැගිලි සහ ඉදිකිරීම් කොමිසම හට උපකාර කල හැකිය.
**www.abcc.gov.au - 1800 003 338**

*අවසන් යාවත්කාලීන කිරීම 2021 ජූලි*